පසුගිය මැයි 09, 2022 දින පිරිසක් විසින් ගාලු මුවදොර සහ අරලියගහ මන්දිරය ඉදිරිපිට විරෝධතා කරුවන්ට පහර දීම සමඟින්, රට පුරා පැතිර ගිය නොසන්සුන්තාව පිළිබඳ විශේෂාංග ලිපියක්, දිවයින ඉරිදා සංග්‍රහය (මැයි 15, 2022) තුළ පළ වී තිබිණි. එහි සිරස්තලයක් වූයේ, "ආගම්වාදීන් උමන්දාවටත් පහරදීලා" යන්නයි.

ලිපියේ අන්තර්ගතයේ මේ සම්බන්ධයෙන් සඳහන් වී තිබුණේ, "උමන්දාව වැනි පූජනීය සිද්ධස්ථාන වලට පහර දීම ජාතිවාදී ගිනි ඇවිළවීමකි" යනුවෙන් පමණි.

රට පුරා පැන නැගුණු නොසන්සුන්තාවයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති මෙම ලිපිය පුරා එක් තැනක හෝ, මෙම නොසන්සුන්තාවයන් ආගම්වාදී හෝ ජාතිවාදී කණ්ඩායම් විසින් සිදුකළ බවක් ඉදිරිපත් කර නොතිබුණි.

එසේ නම්, මෙම සිරස්තලය ලිපියේ අන්තර්ගතය හා සැසඳෙන්නේ ද?

ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?